# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1933/33 - 2015 සැප්තැම්බර් මස 23 වැනි බදාදා - 2015.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 04 දරන පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය (බස්නාහිර පළාත)

**ධුරයෙන් ඉවත් කිරීම - සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**
**පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බස්නාහිර පළාත)**

බස්නාහිර පළාතේ පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, ධීවර, නිවාස හා ඉදිකිරීම්, නාගරික හා වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධනය පිළිබඳ අමාත්‍ය කැප්ටන් ලලිත් වනිගරත්න වන මම 1989 අංක 04 දරන පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ (බස්නාහිර පළාත) 01 වන කොටසේ 3(8) වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල ප්‍රකාර, බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති ධුරය දරූ බාලගේ දොන් විපුල රෝහණ කුලසිරි යන අයව වහාම ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාජිකත්වයෙන් හා එහි සභාපති ධුරයෙන් ඉවත් කළ බවද, එම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුර දරූ දොන් මහින්ද චිත්‍රසේන රණවීර සහ කහවිටගේ රාජා සූරියකුමාර යන අයව වහාම ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික තනතුරෙන් ඉවත් කළ බවද මෙයින් නිවේදනය කරමි.

කැප්ටන් ලලිත් වනිගරත්න,
පළාත් මාර්ග, ප්‍රවාහන සමුපකාර සංවර්ධන හා වෙළඳ, ධීවර,
නිවාස හා ඉදිකිරීම්, නාගරික හා වතු යටිතල පහසුකම්,
කර්මාන්ත හා ග්‍රාම සංවර්ධනය පිළිබඳ අමාත්‍ය,
බස්නාහිර පළාත.

ලේකම් කාර්යාලය,
අංක 89,
කඩුවෙල පාර,
බත්තරමුල්ලේ දී ය.

10 - 443/1


1A - PG 2610 — 12 (2015/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## බස්නාහිර පළාතේ පළාත් සභාව

1992 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය (බස්නාහිර පළාත)

**ධුරයෙන් ඉවත් කිරීම - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**
**මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (බස්නාහිර පළාත)**

බස්නාහිර පළාතේ පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, ධීවර, නිවාස හා ඉදිකිරීම්, නාගරික හා වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධනය පිළිබඳ අමාත්‍ය කැප්ටන් ලලිත් වනිගරත්න වන මම 1992 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ (බස්නාහිර පළාත) 3(8) වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල ප්‍රකාර, බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුර දූරූ උත්පල ඕෂනී රම්මුතුපුර, කොග්ගල හේවගේ සංජීව ධම්මික හේමසිරි සහ ඉදිරිමුණි ටෙරිසන් සොයිසා යන අයව වහාම ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික තනතුරෙන් ඉවත් කළ බව මෙයින් නිවේදනය කරමි.

කැප්ටන් ලලිත් වනිගරත්න,
පළාත් මාර්ග, ප්‍රවාහන සමුපකාර සංවර්ධන හා වෙළඳ, ධීවර,
නිවාස හා ඉදිකිරීම්, නාගරික හා වතු යටිතල පහසුකම්,
කර්මාන්ත හා ග්‍රාම සංවර්ධනය පිළිබඳ අමාත්‍ය,
බස්නාහිර පළාත.

ලේකම් කාර්යාලය,
අංක 89,
කඩුවෙල පාර,
බත්තරමුල්ලේ දී ය.

10 - 443/2

---

## බස්නාහිර පළාතේ පළාත් සභාව

1994 අංක 02 දරන කර්මාන්ත සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය (බස්නාහිර පළාත)

**ධුරයෙන් ඉවත් කිරීම - සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**
**කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බස්නාහිර පළාත)**

බස්නාහිර පළාතේ පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, ධීවර, නිවාස හා ඉදිකිරීම්, නාගරික හා වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධනය පිළිබඳ අමාත්‍ය කැප්ටන් ලලිත් වනිගරත්න වන මම 1994 අංක 02 දරන කර්මාන්ත සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ (බස්නාහිර පළාත) 29(2) වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල ප්‍රකාර, බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති ධුරය දූරූ අන්දරගේ දෙන් කුමාරසිරි යන අයව වහාම ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සාමාජිකත්වයෙන් හා එහි සභාපති ධුරයෙන් ඉවත් කළ බවද, එම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුර දූරූ විජිත වන්නිආරච්චි සහ ඉසුරු උත්පල අබේවර්ධන යන අයව වහාම ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික තනතුරෙන් ඉවත් කළ බවද මෙයින් නිවේදනය කරමි.

කැප්ටන් ලලිත් වනිගරත්න,
පළාත් මාර්ග, ප්‍රවාහන සමුපකාර සංවර්ධන හා වෙළඳ, ධීවර,
නිවාස හා ඉදිකිරීම්, නාගරික හා වතු යටිතල පහසුකම්,
කර්මාන්ත හා ග්‍රාම සංවර්ධනය පිළිබඳ අමාත්‍ය,
බස්නාහිර පළාත.

ලේකම් කාර්යාලය,
අංක 89,
කඩුවෙල පාර,
බත්තරමුල්ලේ දී ය.

10 - 443/3

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.